# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## කුඩාබුත්ගමුව ශ්‍රී පියදස්සනාරාම විහාරස්ථ කාර්යසාධන සමිතිය (සංස්ථාගත කිරීමේ)

**කුඩාබුත්ගමුව ශ්‍රී පියදස්සනාරාම විහාරස්ථ කාර්යසාධන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

දිගාමඩුල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීනි ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය විසින්
2011 ජනවාරි මස 05 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2010 දෙසැම්බර් මස 06 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[62 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 003790—750 (2009/03)

## කුඩාබුත්ගමුව ශ්‍රී පියදස්සනාරාම විහාරස්ථ කාර්යසාධන සමිතිය (සංස්ථාගත කිරීමේ)

### කුඩාබුත්ගමුව ශ්‍රී පියදස්සනාරාම විහාරස්ථ කාර්යසාධන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"කුඩාබුත්ගමුව ශ්‍රී පියදස්සනාරාම විහාරස්ථ කාර්යසාධන සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන සමිතියක් එකී සමාජිකයන් එකඟ වූ රීති අනුව එහි පරමාර්ථ සහ ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් ද, එකී සමිතිය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2011 අංක...... දරන කුඩාබුත්ගමුව ශ්‍රී පියදස්සනාරාම විහාරස්ථ කාර්යසාධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

කුඩා බුත්ගමුව ශ්‍රී පියදස්සනාරාම විහාරස්ථ කාර්ය සාධන සමිතිය සංස්ථාගත කිරීම.

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) කුඩාබුත්ගමුව ශ්‍රී පියදස්සනාරාම විහාරස්ථ කාර්යසාධන සමිතියේ දැනට සාමාජිකයන් වශයෙන් සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් සඳහන් කරනු ලබන) කුඩාබුත්ගමුව ශ්‍රී පියදස්සනාරාම විහාරස්ථ කාර්ය සාධන සමිතිය යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතුය. තවද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකිය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) විහාරස්ථානයේ ආරක්ෂාව, නඩත්තුව හා වර්ධනය සලසාලීම;

2—PL 005421—750 (2011/01)

(ආ) නේවාසික භික්ෂූන්වහන්සේලාගේ ආරක්ෂාව හා අවශ්‍යතාවයන් සපුරාලීමට කටයුතු කිරීම;

(ඇ) විහාරස්ථානයට අයත් ප්‍රදේශයේ ආගමික, සමාජික, ආර්ථික වර්ධනයට හේතුවන කටයුතු සඳහා සහයෝගය දීම;

(ඈ) බුදුදහමේ ස්ථිර පැවැත්ම සඳහා කටයුතු කරන අතරම, බෞද්ධ චර්යාධර්ම පදනම් කරගත් පන්සිල් රකින සාමාජයක් බිහි කිරීමට කටයුතු කිරීම;

(ඉ) බෞද්ධ විහාරස්ථානයකින් අපේක්ෂිත සමස්ථ කාර්ය භාරය ඉටු කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම ;

(ඊ) අනාථ, ආබාධිත, මහළු හා ගිලන් සහ අවතැන් වූ පුද්ගලයන්ගේ සුභසාධනය පුහුණුව සහ පුනරුත්ථාපනය සඳහා ආයතන පිහිටුවා පවත්වාගෙන යාම;

(උ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය, හිතකර හා ආනුෂංගිකවන වෙනත් කාර්යයන් ඉෂ්ට කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු ප්‍රධාන සභාපති වශයෙන් නිල බලයෙන්ම පත්වන විහාරාධිපතින් වහන්සේ සහ මහාසභා රැස්වීමක දී තෝරාගනු ලබන උප සභාපති, ලේකම්, සහකාර ලේකම්, භාණ්ඩාගාරික සහ කාරක සභිකයන් පස්දෙනෙකුගෙන් සමන්විත කෘත්‍යාධිකාරී මණ්ඩලයක් විසින් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව පාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කෘත්‍යාධිකාරී මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සමිතියේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ ධුර දරමින් සිටි තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ බලතල.

5. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන දෑ කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන යම් නිශ්චල, දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම

හෝ වෙනත් යම් ආකාරයකින් නීයාදනය කිරීම, බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන සියලු ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට කෙලින්ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ නියෝජිතයකු මාර්ගයෙන් ඇතුළත්වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම ;

(ඇ) මුදලින් හෝ ද්‍රව්‍යවලින් ත්‍යාග, පරිත්‍යාග හෝ රික්තවරණ භාර ගැනීම ;

(ඈ) ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, භාර ඇති කිරීම සහ පරිපාලනය කිරීම සහ යම් බැංකුවක ජංගම තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යාම;

(ඉ) පොත් වාර ප්‍රකාශන, සඟරා සහ වෙනත් ලිපි ලේඛන ප්‍රසිද්ධ කිරීම හෝ ප්‍රසිද්ධ කිරීමට කටයුතු යෙදීම සහ පුස්තකාල පොත් සාප්පු සහ මුද්‍රණාල පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(ඊ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන මුදල් සුදුසු යැයි සංස්ථාව විසින් සඳහන් කරනු ලබන ආකාරයට සහ එසේ සුදුසු යැයි සලකනු ලබන ඇප මත මුදල් අත්තිකාරම් දීම හෝ ණයට දීම හෝ ණයට ගැනීම;

(උ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, මාරුකිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වා ගෙන යාම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නියම කිරීම සහ ;

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්ම කිරීම හෝ ඉටු කිරීම සඳහා අවශ්‍යවන ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාවට සාමාජිකයන් ඇතුළු කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ සාමාජිකත්වයෙන් නෙරපීම, සංස්ථාවේ ධුර දරන්නන්ගේ බලතල, චර්යාව සහ කාර්ය සංස්ථාවේ රැස්වීම්වල කටයුතු කිරීමේ දී අනුගමනය කළයුතු කාර්ය පරිපාටිය, සංස්ථාවේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ චර්යාව, කාර්ය සහ කර්තව්‍ය සම්බන්ධයෙන් සහ සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ වාර්ෂික මහාසභා රැස්වීමකදී හෝ තත්කාර්යය සඳහා සති දෙකක් කල් දී කැඳවනු ලබන විශේෂ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් යටත් පිරිසෙයින් තුනෙන් දෙකක ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල සාදනු ලැබීම නිත්‍යානුකූල වන්නේ ය. එවැනි රීතියක් සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් එය වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනය ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී බලපැවැත්වූ සමිතියේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති වශයෙන් සළකනු ලැබිය යුතුය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**7.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග, සම්මාදම් මුදල් හෝ ගාස්තු වශයෙන් ලැබෙන සියලු මුදල් කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා යම් අගය ක්ෂයවීමේ අරමුදලක්, සංචිතයක් හෝ නිධන් අරමුදලක් සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

8. සභාපතිවරයා ද ලේකම් හෝ භාණ්ඩාගාරික යන දෙදෙනාගෙන් එක් අයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතුය. ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු අතර, ඒ අත්සන කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

විගණනය හා ගිණුම්.

9. (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(ආ) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම්, බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(ඇ) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ “සුදුසුකම් ලත් විගණකවරයා” යන්නෙන් -

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්

අදහස් වේ.

සද්භාවයෙන් කරන ලද ක්‍රියා සඳහා වගකීමෙන් නිදහස් කිරීම.

10. මේ පනතින් හෝ ඒ යටතේ පවරනු ලැබූ බලතල ප්‍රකාර නැතහොත් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහිලා යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීමට හෝ වෙනත් නීති කෘත්‍යයකට ඒ තැනැත්තා යටත් නොවන්නේ ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම් වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.